# හද රිදවන මතක සුවඳ



**රෝහිත මුණසිංහ**
ප්‍රංශයේ සිට

28

මට විමලසේන සහෝදරයා හඳුනා ගැනීමට මඟ පෑදුණේ ඥානපාල මාර්ගයෙනි. පැරිසියට පා තබා ගතව ගිය දෙවැනි මාසයේ දිනක මා හමුවන්නට පැමිණි ඥානපාල පුල්ස්කැප් පිටු පහක් පුරා ලියැවුණු කථා පුවතක් මට කියවීමට දුන්නේ මෙසේ කියමිනි.

-සහෝදරයා, පක්ෂයේ ඉහළ අයත් එක්ක සම්බන්ධකම් පවත්වපු සහෝදයෙක් ඇවිල්ලා ඉන්නවා. මේ කථාවේ විදියට මිනිහා දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ වැඩවලටත් සම්බන්ධයි. මේක තමයි මිනිහා ධගතගජගසෘග් එකට දාන්න ලියපු කථාව. මට මේක කියෝපුවහම ටිකක් සැක හිතුණා මේ සේරම ඇත්තද කියලා. මේක කියවලා බලලා ඔහේගේ අදහස කියන්න.”

මම එක්වරක් නොව තෙවරක් එම ලියවිල්ල කියවුයෙමි.

-සමහර තැන්වල ගැටලු තියෙනවා. ඒත් මිනිහා පක්ෂයට සම්බන්ධ කෙනෙක් තමයි.”

මම මගේ නිගමනය ඥානපාලට පැවසුවෙමි.

එයින් මාස කිහිපයක් ඉකුත්ව යද්දී විමලේ මගේ හිත්ගත් මිත්‍රයෙකු වුවා පමණක් නොව ඔහු, ඔහුගේ හදවත විවෘත කළහැකි මිත්‍රයෙකු වශයෙන් මා සලකන බැව්ද හැඟිණ. විමලේ ඔහුගේ හදවත මා අබියස දිග හැරියේ මෙසේය.

-සහෝදරයා, මට ලොකු දේශපාලන දැනුමක් තිබුණේ නෑ. මම පංති කරලා තිබ්බේ නෑ. ඒත් මට මේ පක්ෂය ගැන ලොකු ආදරයකුත්, කාලකන්නි යූ. ඇන්. පී ආණ්ඩුව ගැන මහා අප්පිරියාවකුත් තිබුණා. මට කොක්ක වැදිලා පක්ෂයට සම්බන්ධ උනාම ගමනායක සහෝදරයා මගෙන් ඉල්ලුවේ එකම එක ඉල්ලීමයි.”

-සහෝදරයා, අපිට සහෝදරයගෙන් වෙන මොනවත්ම එපා. විශ්වාසය විතරක් දෙන්න. අපි සහෝදරයට භාරදෙන මිනිස්සුන්ට රැකවරණය දෙන විශ්වාසය විතරක් දෙන්න.”

-මම ගමනායක සහෝදරයට ඒක පොරොන්දු උනා. ඊට පස්සේ කොළඹ සන්නද්ධ අංශෙ නායකයා -පතී” හිටියේ මම ළඟමයි. තව සහෝදරවරු කිහිප දෙනෙක්ම මගේ ලග හිටියා. මගේ බේකරියේ හත්අට දෙනෙක් වැඩකරා. නිතර අමුත්තෝ ආවා. ගියා. ඒ නිසා කාටවත් සැක හිතුනෙ නෑ. පතී කියන්නේ මහ පුදුම චරිතයක්. කොළඹ අවට විතරක් නෙවි පිට පළාත්වල තිබුණ ප්‍රහාරවලටත් පතී ගියා. පතීට කිසිම නිදහසක් තිබුණෙ නෑ. එක දවසක් පතී මට කිව්වා, -මහත්තයෝ එක වෙලාවක මට හිතෙනවා මේ තුවක්කුවෙන්ම ඔළුවට වෙඩිතියා ගන්න” කියලා. සමහර වෙලාවට ඒ වගේ මානසික පීඩනයකින් හිටියත් පුදුමාකාර ජීව ගුණයක් තිබුණ මිනිහෙක්.”

එක් දිනක විමලේ මට විස්තර කළේ තමා ද සම්බන්ධ වූ විශේෂ සිද්ධියකි. එම සිද්ධියට ශ්‍රී ලංකාවේ පුවත්පත්වලින් විශාල ප්‍රචාරයක් ලැබුණු අතර ආරක්ෂක අංශ හා රාජ්‍ය දෙදැරුම් තැබූ සිද්ධියක් විය.

- ඒ ඔපරේෂන් එකේ (මෙහෙයුමේ) සෑම පියවරක්ම අපි සාර්ථකව අවසන් කළා. අන්තිම තැනට එනතුරු වාහන තුනක් මාරුකරා. ඔන්න ඊළඟට තමයි පුදුම වැඩේ උනේ. ඊට පහුවෙනිදා බලනකොට 13 ක් තියෙන්න ඕන තැන තියෙන්නේ 12 යි. ඒකට සම්පූර්ණයෙන් වගකියන්න ඕන භාණ්ඩාගාරික වශයෙන් හිටපු ‘ආරියදාස’. එකක් අතුරුදහන් උනේ එයාගේ භාරයේ තියෙද්දී. පතිත් මේ ගැන හරියට කලකිරුණා.

අපි ජිවිත පූජාවෙන් ගෙනාපු දේ, හෙට අනිද්දට සෝමවංශ අමරසිංහ සහෝදරයා හමු උනාම මම මේ ගැන ප්‍රශ්න කරනවා. මොකද ඒ වේලාවේ ඒ වගේ දේවල්වලට වගකිවයුතු නායකයා වෙලා හිටියේ එයා.

........... කොහොම කොහොම හරි අන්තිමට මොකද උනේ. දිගට හරහට පාව දෙන්න ගත්තේ බඩඑළිය යන්න වගේනේ. පතී නැතිඋන දවසෙම මම දැන ගත්තා ඔක්කොම ඉවරයි කියලා. අර මනුස්සයා නැත්තම් මගේ ඇටකටුත් බල්ලෝ සුප්පු කරලා හුගක් කල්.”

විමලේ අර මනුස්සයා යයි කීවේ සෙන්පති ඩෙන්සිල් කොබ්බෑකඩුව සමඟ අරාලි තුඩුවේදී ඝාතනයට ලක් වූ බ්‍රිගේඩියර් විජය විමලරත්නයන්ට ය. ව්‍යාපාරික සම්බන්ධතා මත හොඳින් දැන හඳුනාගෙන සිටි විජය විමලරත්න මහතා තමා හමුදා අත්අඩංගුවෙන් මුදවා වහාම රටින් පිටවී යන්නැයි උපදෙස් දුන්බව විමලේ නැවත නැවත සිහිපත් කළේ කෘතවේදීව ය. ඔහු එම සෙන්පතියන් දෙදෙනාට පින් පමුණුවා පැරිසියේ විහාරස්ථානයකට දානයක් ද පිරි නැමුවේ ය.

ප්‍රංශයට පැමිණෙන විදේශිකයන්ට ප්‍රංශ භාෂාව ඉගෙන ගැනීම සඳහා රජය මඟින් නොමිලයේ පවත්වන ප්‍රංශ භාෂා පන්ති බොහෝමයක් තිබේ. ඇත්ත වශයෙන්ම ප්‍රංශ ඉගෙන ගත හැක්කේ ප්‍රංශ භාෂාවෙන්ම උගන්වන මේ පංතියකට ගිය විටදී ය. එහෙත් අපේ ඇත්තෝ සිංහල ගුරුවරු ප්‍රංශ උගන්වන පංති දෙක තුනකට ද ගියහ. මෙයින් එක පංතියක් පවත්වන ලස්සේ මාස්ටර් ය. මා එවිටත් දිනපතා පැවැත්වෙන ප්‍රංශ පංතියකට යමින් සිටිය ද ඉරිදා පමණක් පැවැත්වෙන මාස්ටර්ගේ පංතියට ගියේ ප්‍රංශයට පා තැබූ දිනම හඳුනාගත් ඔහු සමඟ තිබූ හිතවත්කම නිසාත් අපේ අය මුණගැසී කථාබස් කිරීමේ ආස්වාදය විඳීමටත් ය. මගේ බල කිරීම නිසා විමලේ ද මේ පංතියට ආවේ ය.

-ප්‍රෑන්ක් දෙසීයක් ගෙවලා මේ පංතියට මම එන එකේ තේරුමක් නෑ සහෝදරයා. මගේ ඔළුවේ තියන ප්‍රශ්නවලට මේ උගන්නන කිසිම දෙයක් මට මතක හිටින්නේ නෑ.”

ඉගෙන ගනිමුයි මා කොතෙකුත් පෙරැත්ත කළ ද ඔහු පංතියට නෑවිත් ඇරියේ ය. එහෙත් ඉඩලද විටක අපි හමුවුයෙමු.

-මට බිස්නස් නැතිඋනා. වාහන දේපළ නැතිඋනා. රටදාලා එන්න උනා. අන්තිමට ගෑනිත් නැතිඋනා. මේකි වෙන මොකා එක්ක ගියත් මට ඉවසන්න තිබුණා. මට ඉවසන්න බැරි මම අත්අඩංගුවට ගත්ත පොලිස්කාරයා එක්කම මේකි ගිය එකයි. ගෑනි පෙනුම තමයි. ඒත් උෟ නම් බලන්න ඇත්තේ මම නැති උනායින් පස්සේ ගෑනිට තියන දේපළ ගැන.”

මා හමුවන්නට එන බොහෝ දිනවල විමලේ රතුවයින් බෝතලයක් ගෙන එයි. සිහින් උත්තේජනයක් මිස වයින් වෙරිවෙන බීමක් නොවේ. විමල්ගේ රත්පැහැවී ඇති දෙනෙත කැකෑරෙන්නේ වෛරයකින් මිස බීමතින් නොවන බව මා දනියි.

-එක අතකින් බලනකොට මගේ වැරැද්ද සහෝදරයා. මම කරපු දේශපාලනේ නිසා මට රටත් අත්ඇරලා පැනලා එන්න සිද්ධ උනා. ඒ ගෑනි තනි උනා. අසරණ උනා. අරූ (පොලිස් කාරයා) ගෑනි බයකර ගන්න ඇති.”



වෙනතක බැඳුණ තම බිරිඳ ගැන ඊළඟ මොහොතේ ඔහු හෙළුවේ සානුකම්පිත බැල්මකි. සෝමවංශ අමරසිංහ සහෝදරයා සමඟ පළමු සාකච්ඡාව කළ දිනට පසුවදාම විමලේ මා සොයා ආවේය.

-මම අර 13 න් එකක් නැතිවෙච්ච එක ගැනත් ඇහුවා. ඒවා ගැන දැන් කථා කරලා වැඩක් නෑ කිව්වා. ලොක්ක මම කිව්ව කිසිම දෙයක් පිළිගත්තේ නෑ. අපි කරපු ඔක්කොම හරි. වැරදි මුකුත් නෑ. මගේ පඩිය කීයද ඇහුවා. පක්ෂයට මාස්පතා ප්‍රැන්ක 200 ක් දෙන්න කිව්වා. මම ඔන්න ඒකටත් -හා” කිව්වා. මට දැන් මොනවද නැතිවෙන්නෙ තියෙන්නේ ?”

විමලේ නොනවත්වාම කියවාගෙන ගියේ ය.

කාලයාගේ ඇවෑමෙන් ඔහු බිරිඳ ගැන අමතක කර හෝ මතක යටපත් කරගෙන ජිවිතයට මුහුණ දෙමින් සිටියේ ය. විමලේ නැවතත් කෝපයෙන් හා ශෝකයෙන් වියරු වැටුණේ තම එකම දරුවා වන පුත්‍රයා පා ඇති තත්ත්වය සම්බන්ධයෙනි.

-අරූ මගේ කොල්ලට හරියට වෙනස්කම් කරනවලු. ගහනවා කියලත් ආරංචියි. ගෑනි උෟට බයයි. මම පුතා ටික දවසකට නැන්දා කෙනෙක් ළඟ නැවැත්තුවා. අරූ මගේ කොල්ලා මරලා දැම්මොත් ?”

දේශපාලන රැකවරණ යටතේ සිටින කෙනෙකු නොගන්නා තරමේ අවදානම් තීරණයක් තම දරුවා වෙනුවෙන් ගැනීමට විමලේ තීරණය කළේ ය. යම් තීරණයක් ගැනීම සඳහා තම පුත්‍රයා සමඟ කථා කිරීමට හොර රහසේම ශ්‍රී ලංකාවට යාම එම අවදානම් කාර්යයයි. දේශපාලන රැකවරණය යටතේ සිටින කෙනෙකුට තම රටට යා නොහැක. ගොස් අසුවී නම් දේශපාලන රැකවරණ දුන් රටින් පිටුවහල් කෙරෙයි. එහෙත් ඔහු තම එකම පුත්‍රයා වෙනුවෙන් එම අවදානම් ක්‍රියාව නිර්භීතවම කළේ ය.

පළමුව ඉන්දියාවට හෝ වෙනත් රටකට ගොස් එතැන් සිට ශ්‍රී ලංකාවට ගිය විමලේ සිය පුත්‍රයා දැක සියල්ල කථාබස් කරගෙන නිරුපද්‍රිතව නැවත ප්‍රංශයට ආවේය. එතැන් පටන් ඔහුගේ එකම සිහිනය වුයේ පුත්‍රයා ප්‍රංශයට ගෙන්වා ගැනීම ගැනය. දරුවාගේ මවගේ එකඟත්වයක් නොමැතිව දරුවෙකු ප්‍රංශයට ගෙන්වා ගැනීම කෙසේවත් ලෙහෙසි පහසු දෙයක් නොවේ. එහෙත් මේ සියලු කාර්යයන් සඳහා හදවතින්ම උදව් කිරීමට විමලේට කලණ මිතුරෙක් සිටියේ ය. හේ නමින් පුෂ්පසිරි ය.

-සහෝදරයා කොල්ලා ප්‍රංශෙට ගෙනැල්ලා මට උෟ හදාගන්න පුළුවන් වෙයි ද?” විමලේ මගෙන් විමසුවේ වරක් දෙවරක් නොවේ.

-මොකද බැරි?”

-නෑ මං අහන්නේ අම්මා කෙනෙකුත් නැතිව ?”

-ප්‍රංශෙ ඉන්න හුගක් ළමයි ඉන්නේ අම්මයි, බාප්පයි එක්ක. එක්කො තාත්තයි, කුඩම්මයි එක්ක, ඔයා බය නැතිව දරුවා ගෙන්න ගන්න කෝ.”

ප්‍රංශයේ රාජ්‍ය ආයතන සමඟ ගනුදෙනු කිරීමේදී විමලේගේ කලණ මිතුරාට ඇති පළපුරුද්ද නිසාත්, ඔහුට ඇති ප්‍රමාණවත් ප්‍රංශ දැනුම නිසාත් වැඩි කලක් ඉක්මයා නොදීම විමල්ගේ පුත්‍රයා ප්‍රංශයට පා තැබීය. එයින් පසු විමලේ හිටියේ රටක් රාජ්‍යයක් හිමි වුවෙකු පරිද්දෙන් ය.

ඉන් මාස කිහිපයක ඇවෑමෙන් විමලේගේ ඇසුරින් මා අත්වින්දේ මවකගේ රැකවරණය හා සෙනෙහස නොමැතිව දරුවෙකු හදා ගැනීමට පියෙකුට ඇති දුෂ්කරතාව ගැන ය.

-සහෝදරයා, මට දැන් තියෙන එකම බය මේ ළමයා ප්‍රංශෙට ගෙනැල්ලා ඉගෙන නොගත්තොත් කියන එක ගැනයි. ඉස්කෝලෙ විඩ ගෙදරදි කියලා දෙන්න මට ප්‍රංශ තේරෙන්නෙත් නෑ. පුතා ගෙදර ඉන්න වෙලාවට කරන්නේ ටී.වී. එක බලන එක විතරමයි. කොච්චර උනත් අම්මාත් මතක් වෙනව ඇති. එක දවසක් මට තරහා ගිහිල්ලා ටෙලි කොමාන්ඩ් එක (දුරස්ථ පාලනය) බිල්ඩිමේ ජනේලෙන් එළියට විසිකරලා දැම්මා.”

එහෙත් කල්ගතවෙත්ම විමලේගේ පුත්‍රයා සිය අධ්‍යාපන කටයුතු හොඳින් කරගෙන යන්නට විය. තමාට ඇති වෘත්තීය පළපුරුද්ද අනුව විමලේට ලබාගත හැකිවුයේ පාන් නිපදවන බේකරියක රැකියාවකි. වසර කිහිපයක් මෙම රැකියාවේ යෙදී සිටි ඔහුගේ දකුණු උරහිසේ ආබාධයක් ඇතිවිය. එය සැත්කමක් කිරීම දක්වා දුරදිග ගියේ ය.

විමලේගේ බිරිඳ හදිස්සියේම ප්‍රංශයට ආවේ මෙම කාලයේ ය. විමලේ ඇය මුණ ගැසුණා දැයි මට නිශ්චිතවම කිව නොහැකි නමුදු සිය පුත්‍රයා හා මව මුණ ගැසීම මට විස්තර කරන ලද්දේ විමලේ නොවේ. මෙම ප්‍රශ්නයට සෘජුවම මැදිහත් වූ විමලේගේ කලණ මිතුරා ය.

-ළමයා අම්මා බලන්න යන්න බැහැමයි කිව්වා. අපි බලෙන් වගේ එක්කරන් ගියේ. අම්මා පුතාට රත්තරං චේන් එකක් හදාගෙන ඇවිල්ලා පුතාට ඒක දුන්නා. ළමයා ඒක අතට ගත්ත ගමන් පුබෙල් එකට (කුණු බාල්දියට) දැම්මා.

ඔහු මට එම සිද්ධිය විස්තර කළේ වාක්‍ය කිහිපයකින් වුවද ශෝකාන්ත සිනමා පටයක ඇති දුක්බර දර්ශනයක් මෙන් එම භාවාතිෂමය අවස්ථාව මගේ මනස් තිරයේ ඇඳීගියේ සාංකාකුල වූ ශෝකයකින් මහද බර කරමිනි. ජිවිතයේ ගමන් මග වරද්දාගත් එම මවගේ මුහුණේ පිළිබිඹු වූ හැඟීම් මෙසේ වන්නට ඇතැයිද, තාත්තා මානසිකව වධ විඳින්නේ අම්මා කළ වැරැද්දක් නිසායයි තේරුම්ගත් පුතෙකුගේ හැසිරීම් හා ප්‍රතිචාර මේ ආකාර

31 වන පිටට